

රුසියානු මහා කවි

ව්ලදිමීර් මයාකෝව්ස්කි

ඊත්තු විත්ති

රුසියානු මහා කවි

ව්ලදිමීර් මයාකෝව්ස්කි

සත්තු විත්ති

චිත්‍ර

යූ.කරෝවින්

අනුවාදය

© රන්ජන දේවමිත්‍ර සේනාසිංහ

ISBN 978-955-0230-16-7

නව පරිගණක සකැසුම

මාලක ලලනජීව

මුද්‍රණය

ප්‍රකාශනය

අගහස් ප්‍රකාශන

717/2, මාදින්නාගොඩ, රාජගිරිය.

ප්‍රථම මුද්‍රණය 2013

රුසියානු මහා කවි

ව්ලදිමීර් මයාකෝව්ස්කි

සත්තු විත්ති

චිත්‍ර

යූ.කරෝවින්

අනුවාදය

රන්ජන දේවමිත්‍ර සේනාසිංහ



අගහස් ප්‍රකාශන
717/2, මාදින්නාගොඩ, රාජගිරිය.



ව්ලදිමීර් මයාකෝව්ස්කි

මේ නමින් හැඳින්වෙන්නේ 20 වැනි සියවසේ රුසියාවේ වාසය කළ සාහිත්‍යධරයෙක්. ඔහු නාට්‍යවේදියෙක්, චිත්‍රපට තිර රචකයෙක්, චිත්‍රපට අධ්‍යක්ෂවරයෙක් හා නළුවෙක්, චිත්‍ර ශිල්පියෙක් හා සඟරා සංස්කාරකවරයෙක්. එහෙත් ලෝකයේ ජනයා අතර ඔහු වැඩියෙන් ප්‍රකට වුණේ සමාජවාදී අදහස් ඇති, විප්ලවකාරී කවියකු හැටියට.

1893 දී ඔහු උපත ලද්දේ රුසියානු අධිරාජ්‍යයේ බග්දාති කියන නගරයේ. එය අයත් වන්නේ දැන් ජෝර්ජියාව ලෙස හැඳින්වෙන රටටයි. ඔහුට සහෝදරියන් දෙදෙනෙක් හා සහෝදරයින් දෙදෙනෙක් සිටියා. සහෝදරයින් දෙදෙනා කුඩා කාලයේ දී ම ලෙඩරෝග හැදිලා මියගියා. කවියාගේ වයස අවු. 13 දී ඔහුගේ පියාත් ගිලන් වී මියගියා. පස්සේ ඔවුන් මොස්කව් නුවරට පැමිණියා. මයාකෝව්ස්කි මොස්කව්හි පාසැලකට ඇතුළු කළත් ගාස්තු ගෙවාගන්නට බැරිවීම නිසා ඔහු පාසැලෙන් ඉවත් කෙරුණා. 1908 දී දේශපාලන කටයුතුවල නියැලෙන්නට පටන් ගන්නා ඔහු ඒ නිසාම නොයෙක් තාඩනපීඩනවලට ලක් වෙනවා. සිරගතව සිටියදී කවි ලියන්න පටන් ගන්න මයාකෝව්ස්කි ඉන් නිදහස් වූ පසු චිත්‍රශිල්පියකු ලෙස පුහුණුව ලබනවා. ඔහුගේ කලා ජීවිතය ආරම්භ වන්නේ ඒ ආකාරයෙන්.

මේ කවියා ගැන ඔහු ජීවත් ව සිටි කාලයේ ම පුරාවෘත්ත ගොඩනැඟුණා. ඉන් එකක කියැවුණේ, සෝවියට් දේශය නමැති සමාජවාදී රටේ සද්දන්ත යෝදයෙක් ඉන්නා බවත් ඔහු කවි කියනා බවත් ඔහු රතු නැවක පිහිටි කපිතාන්ගෙ අණදෙන කුටියට නැඟිලා කියන කවි මහ මුහුදුවලින් එතෙර ඈත රටවලටත් සෝවියට් දේශය රකිමින් මුර සංචාරය කරන නෞකාවලටත් ඇසෙන බවත් ඒ අසන නැවියන් සෝවියට් දේශයේ හතුරන් පළවා හරින්නට යුහුසුලු වන බවත්.

මයාකෝව්ස්කි කවියාගේ ශරීර ප්‍රමාණ ගැන කල්පනා කරන විට සැබැවින් ම ඔහුට තිබුණේ යෝධයකුගේ පෙනුමක්. ඔහු ඉතා ම උසයි. ඔහුගේ උරහිස් හරිම පළලයි. ඔහු දැවැන්ත, ශක්තිමත් පුද්ගලයෙක් වුණා. ඔහුගේ කට හඬේ තිබුණේ අසාමාන්‍ය බලයක් හා අලංකාරයක්. එනිසා පැය ගණන් පුරා ඔහු කවි කියනවා අහගෙන ඉන්න මිනිසුන් රැස් කකා සිටි බව සඳහන් වෙනවා. දේශපාලනයෙදි පමණක් නොවෙයි, කවියෙදිත් ඔහු පෙරළිකාරයෙක් වුණා. ඒ, සම්භාව්‍ය කවිය විසින් නොපිළිගත් ගැමි වදන් කවියට ඇතුළත් කරමින් සහ අලුත් කාව්‍ය විරිත් භාවිතයට ගනිමින්. ඒ නිසා ඔහු විවේචනයටත් බඳුන් වුණා.

මයාකෝව්ස්කි කවියා ජීවත් වුණේ ඉතාම කෙටි කාලයයි. අවුරුදු 36ක් පමණයි. 1930 දී මිය යන මේ කවියාගේ සැමරුම් නිමිත්තෙන් සෝවියට් සංගමය හා රුසියාව විසින් තැපැල් මුද්දර ගණනාවක් නිකුත් කර තිබෙනවා. ඒ වගේම ඔහුගේ නමින් මංමාවත්, උමං දුම්රිය ස්ථාන, නගර හා චතුරශ්‍ර නම් කෙරුණා. රුසියාව විසින් මෑතක නිකුත් කරන ලද කාසියකත් ඔහුගේ රුව යොදා තිබුණා. ඔහු වෙනුවෙන් ඉදිකෙරුණු පිළිම ප්‍රතාපවත් ලෙසින් අදත් නැඟී සිටිනවා.

මේ කවියා සැරපරුස පෙනුමෙන් යුතු වුවත් ඔහුට තිබුණේ බොහෝම මටසිලිටි, කරුණාවන්ත හදවතක්. ඒ නිසා සෙසු සියලු කලා කටයුතුවල නියැලෙන අතරවාරයේ පොඩිත්තන් වෙනුවෙන් ලියන්නත් ඔහු කොහොම හරි කාලය සොයා ගත්තා. සිඟිත්තන් වෙනුවෙන් මයාකෝව්ස්කි කවියා ලියූ කුඩා පොත් පිංචක් තමයි අද මේ ඔබට ඉදිරිපත් කෙරෙන්නෙ. රුසියානු බසින් මයාකෝව්ස්කි කවියා ලියූ ඒ කවි මෙහි සිංහල බසින් පළ වන්නේ, හැකිතාක් දුරට සිංහල කාව්‍ය සම්ප්‍රදායයට ගැලපෙන ආකාරයෙන් හැඩගස්වාගෙනයි. ඒ, 2013 වසරට යෙදෙන මයාකෝව්ස්කි කවියාගේ 120 වැනි ජන්ම සැමරුම නිමිත්තෙන්.

දොර අරිනා ලෙසින් ගෙයක
පෙරළනු මැන මුල්ම පිටුව
එහි මුල්තැන රැගෙන සිටින
සිංහයා දැක ගනු පළමුව

ආදි පුරාණේ කාලෙක
සියලු සතුන්ගේ රජු යැයි
අමතන ලද මුත් අද ඔහු
නිකම්ම නායකයෙක් මැයි

දුඹුරු පාට කෙටි ලොම් ඇති
රටවල්වල උතුරුකරේ
ජීවත් වන මේ සතාට
කියන්නෙ ලාමා ය කියල



ලාමා අම්මයි - උගෙ දූ පැටියයි
හරි අහිංසකයි - හොඳ හුරුබුහුටියි

පැස්තුඩුවගෙ පැටියා කහ පාටයි
අම්මගෙ හොටයේ මාලුවො මල්ලයි

පිට වට ගෙල වට ඉරි වට
සීබ්‍රාගෙ හැඩරුව මට
පුම්බන ලද මෙට්ටයකට
සමකළ හැක, අගෙයි නොවෙද ?

හරියට පණ ඇති
රූපෙක සිරි ගති
අපගෙ පොතේ ඇති
ඇතුනගෙ දඟ ගති

ඇත් පවුලේ අති
විසාල පෙනුමැති
දෙමහල් උස ඇති
මහ ඇතු දළ ඇති

කුලු සරි කන් ඇති
මුහුණෙ වලිග ඇති
එහි වෙන නම් ඇති
"හොඬවැල" යැයි යති

කෑම බරට කති
බීම බොහොම බොති
යාර ගණන් ඇති
ඇඳුම් ද අන්දති

ඇත් පවුලේ ඇති
එතරම් උස නැති
පැටවගෙ උස අපෙ
තාත්තටත් නැති


උහු පෙරහැරේ ඒති - සැමගෙන් ඉල්ලති
“පසෙකට වනු හැකි - නම් බොහො යහපති”

මේ වගෙ සිරුරැති - අලි ඇතු වික්‍රමැති
පිටු දෙකකින් වුව - ඇඳිතොත් සමතෙකි



දරුවන් සිත බිය ගන්වන
විදුලි සැරක් වගේ පනින
වතුරේ සිටින විට නොපෙනෙන
කිඹුල කෝප නොකරනු මැන



'කාන්තාරයේ නැව' යැයි - ආදි කාලෙ සිට දන්නා
ඔටුවා පිට මහ බඩු පොදි, - මිනිසුන් නැග, ගෙන යන්නා

රස නැති තණ කොළ කන්නා - සැම දා වැඩෙහිම ඉන්නා
කාන්තාරයෙම වෙසෙනා - කම්කරුවෙකි මොහු අගනා

අරුම පුදුම කැන්ගරුවගෙ
දෑත් යුවල කොටම කොටයි
ඒ වෙනුවට දෙපා යුගල
වලිගෙ එක්ක දිගම දිගයි



බෙල්ල දිගැති ජිරාපයට
ගැලපෙන ඇඳුමක් මැසුමට
සිතුවද, මිම් කොලරයකට
ගනු කෙලෙසද නොදැනේ මට

ඒ වුනාට ජිරාපයට
නැතැයි කමිසයක් ඇඳුමට
නැඟුණේ නැත දුකක් සිතට
හැරවෙනු මිස එය සතුටට

ජිරාප පෝතකයා හට
අම්ම සමඟ සිටිනා විට
ආදරයෙන් වෙළී ඉන්ට
බෙල්ලෙ අගය කියනු කුමට

වඳුර වගේ විහිලුකාර සතෙක් එහෙම තවත් ඇද්ද
වාඩිවෙලා සිටිනා විට මිනිස් රූපයක් ම නොවෙද

මිනිස් රූපෙ ඉක්මවන්නෙ වඳුරගෙ ඇති දිග වලිගෙයි
උඩින් යන්න උදවු කරන වලිගෙට උන් හරි ලෝලයි

සීතල රටවල උන්හට දරා ගන්න බැරි සීතයි
උෂ්ණ කලාපයෙ රටවල උන් හැම දෙන වනවාසයි

සත්තු වත්තෙ කූඩු වෙලා
ඉන්න සතුනි මට අවසර
ගෙදර යන්න වෙලාව හරි
ආයෙත් එන්නම් සුමිතුර

රුසියානු මහා කවි

ව්ලදිමීර් මයාකෝව්ස්කි

සත්තු විත්ති

අගහස් ප්‍රකාශන
717/2, මාදින්නාගොඩ, රාජගිරිය.
0112793671 | 0773985968
roma.lanka@mail.ru

ISBN 978-955-0230-16-7
Rs. 150/-
9"789550"230167"